පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක එන්සීපී/2005/05 (i)

මගේ අංකය:- එන්සීපී/සීඑස්/පීටී/1
ප්‍රධාන ලේකම් කාරයාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුරය.
2005.05.19

ආණ්ඩුකාරවර ලේකම්,
පළාත් සභාවේ ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ
ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

## <u>අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප්</u>

එන්සීපී 2005/05 චක්‍රලේඛයේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේදි ප්‍රායෝගික වශයෙන් මතුවී ඇති ගැටළු සළකා බලා පහත සඳහන් සංශෝධනයන් සිදු කරනු ලබන අතර, එකි සංශෝධන 2005.05.01 දින සිට බලපැවත්වේ.

1. එකි චක්‍රලේඛණයේ 3.2 හා 3.3 වගන්ති රියදුරන්, මුරකරුවන් හා සංචාරක බංගලා භාරකරුවන් සඳහා අදාළ නොවේ. රියදුරන් රාජකාරි සඳහා යොදවා ගැනිමේදි උක්ත චක්‍රලේඛයේ 3.3 සඳහ<u>**න් විශේෂිත දින වලදී නිල වාහන නොවන රියදුරන් රාජකාරියෙහි යෙදීමේදි ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සෘජු අධීක්ෂණය හා වගකීම යටතේ සේවයේ යෙදවිය යුතු බව අවධාරණය කරමි**</u>.

2. ඒ අනුව උක්ත චක්‍රලේඛණයේ 3.8 වගන්තිය රියදුරන්, මුරකරුවන් හා සංචාරක බංගලා භාරකරුවන් සඳහා අදාළ නොවේ.
3. ඉහත චක්‍රලේඛණයේ 3.6 වගන්තිය යටතේ අනුමත කිරීමේ බලතල යටතේ ප්‍රධාන ලේකම් පැය 80 දක්වා වෙනුවට පැය 60 ට වැඩි වශයෙන් සංශෝධනය කෙරේ.
4. ඒ අනුව ඉහත චක්‍රලේඛණයේ අනෙකුත් විධිවිධාන ඒ අයුරින්ම බලපැවත්වේ.

**ජේ.එම්.කරුණාරත්න,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත්:- 1. විගණකාධිපති - දැ.ගැ.ස
2 .අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.පි, අ.ක.ස